# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/30 - 2013 ජූලි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වන උපවගන්තිය යටතේ කරන නිවේදනයයි

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් මෙම නිවේදනයෙන් -

(1) කොළඹ 02, ග්ලේනි වීදියේ සහ විනිසුරු අක්බාර් මාවතේ පිහිටි නිරවුල් හා බදු ඉඩමේ, ඇමෙරිකානු ඩොලර් මිලියන හයසිය පනහක (ඇ.ඩො.මිලියන 650ක) I අදියරේ දී අපේක්ෂිත අවම ආයෝජනයක් සහ රැකියා අවස්ථා තුන්දහසක් (3000) ජනනය කිරීමේ අරමුණෙන් යුක්තව, සුඛෝපභෝගී හෝටලයකින් ද, සම්මේලන මධ්‍යස්ථානයකින් ද, විවේකය, විනෝදාස්වාදය මෙන් ම සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම්වලින් ද, අන්තර්ජාතික ප්‍රමිතියට අනුකූලව වන සාප්පු සංකීර්ණයකින් ද, සුඛෝපභෝගී තට්ටු නිවාස පෙළකින් ද, සේවා පහසුකම් සලසන බද්ධ නිවාස සහ කාර්යාලීය ඉඩකඩ පහසුකම්වලින් ද සමන්විත බහුවිධ ව්‍යාපාරයකින් සංයුක්ත සුඛෝපභෝගී බහුවිධ/මිශ්‍ර උපයෝගිතාවකට සාකල්‍යයෙන් ම ඔබින 'සුප්‍රසිද්ධියේ ප්‍රතිමූර්තියක් බඳු' "සියලු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීර්ණ නිකේතනයක්" අදියර දෙකකින් සංවර්ධනය කිරීම, ඉදිකිරීම, සකස් කොට සම්පාදන කිරීම, උපයෝගීතාවට පැවරීම, හිමිකාරත්වය දැරීම, කළමනාකරණය කිරීම, මෙහෙයවීම, විකිණීම, කල්බදු දීම, කුලියට දීම ඉලක්ක කරමින් මෙම ව්‍යාපෘතිය යථෝක්ත පනතේ කාර්ය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගන්නා ලදුව, ඒ ව්‍යාපෘතියෙන් සැලකිය යුතු ධාරිතාවකින් රැකියා අවස්ථා උත්පාදනය වීම, සතුටුදායක ප්‍රවනතාවයකින් විදේශ විනිමය ගලනය, තාක්ෂණය හුවමාරුවීම මගින් නිපුණතාවන් වැඩිදියුණු වීම, කොළඹ නගරය සංවර්ධනය කිරීමේ උපාය මාර්ගීක වැදගත්කම සහ දිවයිනේ ස්ථාපිත භූ දර්ශනයට නව ස්වභාවයක් එකතු වීම ආදී විශේෂාංග සහ නිර්ණායක හරහා වැදගත් වූත්, සාධනීය වූත් ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ බිහි කිරීම පදනම් කරගෙන හුදෙක් ජාතියේ යහපත සඳහා ම සැකසුණු ව්‍යාපෘතියක් වන බවටත්, මෙහි මින්මතු ව්‍යාපෘති සමාගම වශයෙන් හඳුන්වනු ලබන වෝටර්ෆ්‍රන්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම එකී ව්‍යාපෘතියේ ව්‍යාපෘති සමාගම ("ව්‍යාපෘති සමාගම") වන බවටත්,

(2) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ දිනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර ඇති කරගන්නා වූ ගිවිසුමේ ("ව්‍යාපෘති ගිවිසුම") දැක්වෙන පරිදි විය යුතු බවට ද, සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනයේ I වන අදියරේ වානිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම එකී ව්‍යාපෘති ගිවිසුමේ දැක්වෙන දිනයේ සිට මාස හැටක් (60) ඇතුළත සිදුවිය යුතු බවට ද,


1A - G 017985 — 360 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනයේ II වන අදියර ආරම්භ කළහොත්, වානිජ මෙහෙයුම් කටයුතු ආරම්භ සහ ක්‍රියාත්මක කිරීම එකී ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් වී ඇති පරිදි තව මාස තිස්හයක (36) කාලයක් තුළ ද ඇමෙරිකානු ඩොලර් මිලියන සියයක (ඇ. ඩො. මි. 100) අතිරේක ආයෝජනයක් ද සිදුවිය යුතු බවටත්, මෙයින් ප්‍රකාශ කර සිටියි.

(3) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා, මෙම නිවේදනයේ දැක්වෙන උපලේඛනයේ සඳහන් බදු නිදහස, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව ව්‍යාපෘති සමාගම විසින් සංවර්ධනය කරන, මෙම සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනයට අදාළ කරගත යුතු බවට විශේෂයෙන් සඳහන් කරන බවටත්,

මෙයින්, දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

(1) **2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත**

(i) ***සමාගම් ආදායම් බදු***

සියලුම අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනයේ සූදු කෙලීම් සහ ඔට්ටු ඇල්ලීම් නොවන කටයුතුවලින් ජනනය වන ලාභය සහ ආදායම මත ව්‍යාපෘති සමාගමට ආදායම් බදු පැනවීම සම්බන්ධයෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, ආරම්භක වසර දහයක (10ක) කාලසීමාවක් සඳහා (බදු නිදහස් කාලසීමාව) අදාළ කර නොගත යුතුය.

ඉහතකී බදු නිදහස් කාලසීමාව, ව්‍යාපෘති සමාගමට බදු අයකළ හැකි ලාභයක් උපචිත වන පළමු වර්ෂයේ ආරම්භයේ සිට හෝ නොඑසේ නම් වානිජමය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුනකට (03 කට) පසුව එළඹෙන කාලසීමාවේ සිට හෝ යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවෙන් ආරම්භ විය යුතුය.

ඉහත දැක්වෙන බදු නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව, ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම මත, සියයට හයක ප්‍රතිශතය (6%ක) හෝ හෝටල් කර්මාන්තය ආශ්‍රිතව තත්කාලයේ බලපැවැත්වෙන බදු අනුපාතයෙන් සියයට පනහක ප්‍රතිශතය (50%ක) හෝ යන විකල්ප අවස්ථා දෙකෙන් අවම අනුපාතයට අනුව ඒ බදු නිදහස් කාලසීමාව අවසන් වූ දිනෙන් ඉක්බිතිව ම එළඹෙන වසර පහළොවක (15ක) කාලසීමාවක් සඳහා ("බදු සහන කාලසීමාව") බදු අයකළ යුතුය.

එසේ වුව ද, ඉහත සඳහන් බදු නිදහස් කාලසීමාව සහ බදු සහන කාලසීමාව අවසන් වීමෙන් පසුව ව්‍යාපෘති සමාගමේ ලාභ සහ ආදායම් මත ආදායම් බදු, දේශීය ආදායම් බදු පනතේ තත්කාලයේ බලපැවැත්වෙන විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතුය.

ඉහත කී කාර්ය සඳහා, සූදු සහ ඔට්ටු ක්‍රීඩාවන් මෙහෙයවන්නන්ගෙන් ලැබෙන කුලී මුදල්වලට පමණක් සීමා නොවී එකී කුලී මුදල් ද ඇතුළුව සියලුම කුලී බදුකරුවන්ගෙන් ස්ථාවර සහ/හෝ විචල්‍ය ආකාරයෙන් (කුලී බදුකරුගේ ව්‍යාපාරික කටයුතුවල මට්ටම පදනම් කරගෙන අදාළ කරගනු ලබන කුලී) බදුහිමියා/ඉඩම්හිමියා වන ව්‍යාපෘති සමාගමට ලැබෙන කුලී මුදල් සූදු සහ ඔට්ටු ක්‍රීඩා නොවන කටයුතුවලින් ලබන කුලී මුදල් ලෙස සැලකිය යුතුය.

ව්‍යාපෘති සමාගම සූදු සහ ඔට්ටු ක්‍රීඩාවන් ව්‍යාපාරයේ නිරත වුවහොත්, එමගින් ජනනය වන ලාභ, අදාළ කරගන්නා අනුපාතයකින් ඒ තත්කාලයේ බලපැවැත්වෙන සමාගම් බද්දට යටත් වේ.

(ii) ***ලාභාංශ මත බදු***

බදු නිදහස් කාල සීමාවේ දී උපචිත ලාභයෙන් කොටස්හිමියන් අතර බෙදීයන ලාභාංශ මත බදු නිදහස් කාලසීමාව තුළ මෙන් ම ඉක්බිතිව එළඹෙන වසරක කාලය තුළ ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

(iii) ***රඳවාගැනීමේ බදු***

ප්‍රාග්ධන වියදම සඳහා ලබාගත් විදේශ ණය මුදල් සහ ණය ගැනීම් නිසා ගෙවන පොලිය මත සහ තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු අයකිරීමෙන් සහ ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් විය යුතුය.

උපලේඛනය (සම්බන්ධිතයි)

ව්‍යාපෘති සමාගම කළමනාකරණ ගාස්තු, පුරස්කාර ගෙවීම් සහ අලෙවි ගාස්තු මත රඳවා ගැනීමේ බදු අය කිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් විය යුතුය. එසේ වුව ද මෙම එක් එක් අයකිරීම් හා ගෙවීම් පහත සඳහන් සීමාවන්ට අදාළ කරගත යුතුය. එනම්,

(1) මූලික කළමනාකරණ ගාස්තුව/පුරස්කාර ගෙවීම්, මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ දළ ආදායමෙන් සියයට තුනකට (03%)කට වඩා වැඩි නොවිය යුතුය.

(2) අලෙවි ගාස්තු, මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ දළ ආදායමෙන් සියයට එකයි දශම පහකට (1.5%කට) වඩා වැඩි නොවිය යුතුය.

(3) දිරි දීමනා කළමනාකරණ ගාස්තු, මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ දළ ලාභයෙන් සියයට දහයකට (10%කට) වඩා වැඩි නොවිය යුතුය.

(iv) *උපයනවිට ගෙවීම් බදු*

ව්‍යාපෘති සමාගමේ සේවයේ නිරත වන විදේශීය කාර්ය මණ්ඩලය, උපයන විට ගෙවීම් බද්දෙන් නිදහස් විය යුතුය. එසේ වුවද, මෙම සහනය එවැනි සේවකයන් විස්සක (20ක) උපරිමයට යටත්ව අදාළ කරගත යුතු බවට සීමාවක් ක්‍රියාත්මක විය යුතුය. මෙම සහනය ව්‍යාපෘති සමාගමේ වානිජ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ආරම්භ වන දින සිට එළඹෙන ඉදිරි වසර පහක (5ක) කාලසීමාවක් දක්වා අදාළ කරගත යුතුය. ව්‍යාපෘති සමාගමේ විදේශ කාර්ය මණ්ඩලය වෙනුවට ක්‍රමානුකූලව දේශීය සේවක පිරිසක් සේවයේ යෙදවීමට ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘති සමාගමේ වැඩිම යහපත පිළිබඳ මූලධර්මය පදනම් කරගෙන ක්‍රියා කිරීම අවශ්‍ය විය යුතුය.

(2) **2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත (වැට් බදු පනත)**

ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරන මාස හැටක (60ක) කාලසීමාව තුළ දී, ව්‍යාපෘති සමාගම විසින් අනුමත කරන, ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සහ සේවා ආනයනය කිරීම සහ ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සහ සේවා දේශීය වශයෙන් මිල දී ගැනීම, සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වන අයකිරීම් සහ ගෙවීම්වලින් නිදහස් විය යුතුය. වැට් බදු නිදහස් කාලසීමාව, ව්‍යාපෘති සමාගමට/සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනයට සිදු කරන ඍජු සැපයීම් සඳහා පමණක් නොව කොන්ත්‍රාත්කරුවෙකුට මෙන් ම උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් කොන්ත්‍රාත්කරුවෙකුට සිදු කරන සැපයීම් සඳහා ද අදාළ කරගත යුතුය.

ඉහත කී සහනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන II වන අදියරේ දී තවදුරටත් මාස තිස්හයක් (36ක්) සඳහා අදාළ කරගත යුතුය.

ව්‍යාපෘති සමාගමේ වානිජ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ආරම්භ වීමත් සමග 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ අර්ථානුකූලව අදාල සැපයීම් වටිනාකම මත වැට් බදු ගෙවීම සඳහා ව්‍යාපෘති සමාගම නීත්‍යානුකූලව වගකීමට බැඳී සිටිය යුතුය. එසේ වුව ද ඉහත දැක් වූ පරිදි මූලික වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී සහ II වන අදියරේ දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමව තුළ දී ව්‍යාපෘති සමාගම/සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනය විසින් ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ප්‍රදානය කරන සහනය නොකඩවා ම භුක්ති විඳිය යුතුය.

(3) **2011 අංක 18 දරන වරාය සහා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ එකී සියලු අංගෝපාංගවලින් සපිරි විස්තීර්ණ නිකේතනය ක්‍රියාත්මක කිරීම සඳහා ආනයනය කරන සියලුම අයිතමයන් වරාය සහ ගුවන් සේවා බදු පනතේ අයකිරීම්වලින් සම්පූර්ණයෙන් ම නිදහස් විය යුතුය. (ව්‍යාපෘති සමාගම විසින් ඍජුව ම ආනයනය කිරීම් හෝ කොන්ත්‍රාත්කරුවන් හෝ උප කොන්ත්‍රාත්කරුවන් හරහා සිදු කරවන ආනයනය කිරීම් වුවද,) ව්‍යාපෘති සමාගමට, එහි කොන්ත්‍රාත්කරුවන්ට සහ උපකොන්ත්‍රාත්කරුවන් ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන II වන අදියරේ දී තවදුරටත් මාස තිස්හයක (36ක) කාලසීමාවක් සඳහා ඉහත සඳහන් සහන ප්‍රදානයන්ට හිමිකම තිබිය යුතුය.

(4) **2005 අංක 5 දරන මුදල් පනත**

සංශෝධිත 2005 අංක 5 දරන මුදල් පනතේ විධිවිධාන මත ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුට /කොන්ත්‍රාත්කරුවන්ට සහ උප කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බදු ගෙවීමෙන් නිදහස් විය යුතුය.

උපලේඛනය (සම්බන්ධිතයි)

ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවන්ට සහ උපකොන්ත්‍රාත්කරුවන්ට ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන II වන අදියරේ දී තවදුරටත් මාස තිස්හයක (36ක) කාලසීමාවක් සඳහා ඉහත සඳහන් සහන වලට සමාන සහන ප්‍රදානයන්ට හිමිකම තිබිය යුතුය.

(5) ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සහ සේවා, ආනයනය කිරීම මත පනවන රේගු බදු (රේගු අඥාපනත - 235 පරිච්ඡේදය)

ව්‍යාපෘති සමාගම නමින් හෝ කොන්ත්‍රාත්කරුවන් හෝ උපකොන්ත්‍රාත්කරුවන් මඟින්, එකී සියලු අංගෝපාංග සහිත විස්තීර්ණ නිකේතනය සඳහා අවශ්‍ය කරන ව්‍යාපෘති සමාගම විසින් අනුමත කරන එහෙත් තහනම් ලැයිස්තුවේ සඳහන් වන අයිතමයන් හැර ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රාග්ධනමය ස්වභාවයේ අයිතමයන් සහ ව්‍යාපෘතිය ආශ්‍රිත වෙනත් යම් සියලුම අයිතමයන් ආනයනය කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ යථෝක්ත නිකේතනයේ කාර්ය සඳහා ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි රේගු බදු වලින් නිදහස් විය යුතුය.

එසේ වුවද තහනම් ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ වෙළඳ පොළ තුලින් අවශ්‍ය ප්‍රමාණයට සහ ගුණාත්මකභාවයට සපයා ගත නොහැකි නම් හෝ ගුණාත්මකභාවයෙන් හෝ ප්‍රමාණයෙන් සතුටුදායක ලෙස දේශීය වෙළඳ පොළ තුළින් ලබාගැනීමට නොහැකි නම් සහ එකී විස්තීර්ණ නිකේතනය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් කාලය බාධාවක් වන බවට සලකන්නේ නම්, තහනම් ලැයිස්තුවේ සඳහන් අයිතමයන් ද ආනයනය කිරීම සඳහා සලකා බැලීමක් සිදු කළ යුතුය. එසේ වුව ද, මෙම බදු නිදහස් සහනය ව්‍යාපෘති සමාගමේ යම් තැනැත්තෙකුගේ පුද්ගලික සහ පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ආනයනය කරන යම් කවරම වූ පෞද්ගලික බඩුබාහිරාදිය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය. එසේ වුවද මෙම ගිවිසුම සම්බන්ධයෙන් වන කාරණාවන් සඳහා යම් ආනයනයන් පරීක්ෂා කිරීමට සැලැස්වීම හෝ පරීක්ෂා කිරීමට සැලැස්වීම සඳහා අවසර දීම සම්බන්ධ අයිතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් තවදුරටත් රඳවා තබාගත යුතුය.

මෙම සමාන සහන ප්‍රදානය II වන අදියරේ දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තවදුරටත් මාස තිස්හයක (36) කාලසීමාවක් සඳහා ද අදාළ කරගත යුතුය.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා.ම.
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08 - 151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.